ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් නිර්ණායක

පාඨමාලාව සඳහා සුදුසුකම් නිර්ණායක:

අ) 9 ශ්‍රේණිය හෝ ඊට සමාන කනිෂ්ඨ ද්විතියික මට්ටම සම්පූර්ණ කිරීම.
හෝ
ආ) ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සහ යම් ක්ෂේත්‍රයක අවම වසර දෙකක කාලසීමාවකට සමාන සහතික කළ සේවා පළපුරුද්ද ද අයදුම්කරුගේ වයස අවුරුදු 16 ට නොඅඩු නම් SLQF 1 මට්ටමට ඇතුළත් වීමට සමාන සුදුසුකමක් ලෙස සැලකිය හැකිය.
හෝ
ඇ) මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යයන කමිටුව විසින් පිළිගත් සහ නීති පීඨයේ පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් අදාළ සුදුසුකම් සහ/හෝ අත්දැකීම්.
සහ
ඈ) පාඨමාලාව පවත්වන භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) පිළිබඳ ප්‍රමාණවත් දැනුමක්.

ඉහත කරුණු වලට අමතරව, ආත්තිකත්වයට පත් අයදුම්කරුවන්ට ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය:

අයදුම්කරුවන් 'කොළඹ විශ්ව විද්‍යාලය – ප්‍රධාන එකතු කිරීමේ ගිණුම 335028500002 වෙත රුපියල් 250/- ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය.
අයදුම්පත් ගාස්තුව ගෙවීම පහත විකල්ප හරහා සිදු කළ හැක.

"මහජන බැංකුවේ" ඕනෑම ශාඛාවක්
හෝ
https://pay.cmb.ac.lk/ වෙබ්අඩවියේ ඇති විශ්වවිද්‍යාල වෙබ් ද්වාරය (මාර්ගගත ගෙවීම්) හරහා. ගාස්තු වර්ගය (fee type) ලෙස සඳහන් කළ යුත්තේ: අයදුම්පත් ගාස්තුව-cshr හෝ **Application fee-cshr**

නිසි ලෙස පුරවන ලද අයදුම් පත්‍රය සමඟ පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.
- ජීවදත්ත පත්‍රිකාව (CV)
- අභිප්‍රේරණ ලිපිය (Motivation letter)
- අයදුම්කරුගේ කටයුතු අධීක්ෂණය කළ පුද්ගලයින්ගේ නිර්දේශ ලිපි, විශේෂයන් සමථකරණය හෝ / විකල්ප ආරවුල් විසඳීමේදී පිළිබඳ වෘත්තිකයන්, සිවිල්සමාජ නිලධාරීන් වැන්නන්
- සහතිකපත්‍ර වල පිටපත්

කරුණාකර නිසි ලෙස පුරවන ලද අයදුම්පත සහ ඇමුණුම් ලියාපදිංචි තැපෑලෙන් 2024 සැප්තැම්බර් 06 හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කරන්න.
අධ්‍යක්ෂ,
මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය,
නීති පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 3, ශ්‍රී ලංකාව

සටහන:

1. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

2. අසත්‍ය හෝ නොමග යවන තොරතුරු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එවැනි අයදුම්කරුවන් අනාගතයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය විසින් සපයන ශිෂ්‍යත්ව අවස්ථා සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.